NOV 2017

## ව්‍යාපාර කළමනාකරණ කමිටු (පෙර කන්න) රැස්වීම් වාර්තාව

## ගල්ඔය වම් ඉවුර ව්‍යාපාරය

## 2017 සැප්තැම්බර් මාසය

**01.** රැස්වීම පැවැත්වූ ස්ථානය - නේවාසික ව්‍යාපෘති කළමනාකරණ කාර්යාලීය රැස්වීම් ශාලාව

**02.** පැවැත්වූ දිනය - 2017.09.21

**03.** රැස්වීමේ ප්‍රධානත්වය - නේවාසික ව්‍යාපෘති කළමණාකරු

**04.** සහභාගීත්වය

4. 1 රජයේ නිළධාරීන්

| අ:අ: | නම | තනතුර | ආයතනය |
|---|---|---|---|
| 01 | ඊ. ක්‍රිස්ටි දේශප්‍රිය මයා | නේවාසික ව්‍යාපෘති කළමනාකරු | ගල්ඔය වම් ඉවුර ව්‍යාපාරය |
| 02 | ඒ.පී.කේ. තුඩුවගේ මයා | ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු | අම්පාර |
| 03 | ඩී.ටී.එම්.සමරනායක මයා | කෘෂිකර්ම උපදේශක | මායාදුන්න |
| 04 | ආර්.එම්.එස්. රත්නායක මයා | ඉංජිනේරු සහකාර | ගොනාගොල්ල ඒකකය |
| 05 | ඩබ්.එම්.ඒ.බී.විජේසුන්දර මයා | ඉංජිනේරු සහකාර | වීරගොඩ ඒකකය |
| 06 | ඩබ්.ඒ.ජයන්ත මයා | ලේකම් - පාසැල් සංවර්ධන සමිතිය | ඉගිණියාගල විදුහල |
| 07 | එන්.ටී.ආර්.ජයවීර මයා | ඉංජිනේරු සහකාර | අන්නමලේ/උහන |
| 08 | ඒ.කපිල නිශාන්ත මයා | කෘෂි රක්ෂණ මණ්ඩලය | අම්පාර |
| 09 | ජී.පී.ඒ.සමන් මයා | ඉංජිනේරු සහකාර | අම්පාර ඒකකය |
| 10 | ඒ.අජිත් කුමාර මයා | කෘෂි උපදේශක | උහන |
| 11 | කේ.එස්.කේ. හේරත් මිය | සංවර්ධන සහකාර | වාරි: කලමනා: අංශය |
| 12 | එස්. සන්දීර් ප්‍රසාද් මයා | සංවර්ධන නිලධාරී | වාරි: කලමනා: අංශය |
| 13 | වී. රම්මියා මිය | සංවර්ධන නිලධාරී | වාරි: කලමනා: අංශය |
| 14 | ඒ.එල්.අස්මියා බේගම් මිය | සංවර්ධන නිලධාරී | වාරි: කලමනා: අංශය |
| 15 | ජේ.එම්.අයාස් මයා | සංවර්ධන නිලධාරී | වාරි: කලමනා: අංශය |
| 16 | ඩී.ජී.සුජිත් විජයවික්‍රම මයා | ගොවිජන සංවර්ධන නිලධාරී | උහන |
| 17 | ඉසඩ්.එම්.රිෆාන් මයා | සංවර්ධන නිලධාරී | වාරි: කලමනා: අංශය |

| අ:අ: | නම | ගොවි සංවිධානය | තනතුර |
|---|---|---|---|
| 01. | ආර්.එම්. රම්බන්ඩා මයා | එම්. 5/4 | ගරු සභාපති |
| 02. | වයි.පී.ගුණසේකර මයා | එම්. 08 | ගරු සභාපති |
| 03. | ඩබ්.එම්.ගුණසේන මයා | එල්.බී 19 | ගරු සභාපති |
| 04 | බී.ජී.ජයසිංහ මයා | යූ.බී.3,4,5,6 | ගරු භාණ්ඩාගාරික |
| 05 | ආර්.එම්.ටිකිරි බංඩා මයා | යූ.බී. 01 | ගරු සභාපති |
| 06 | ඇන්.ඇම්.ජයසේකර මයා | එල්.බී.10 | ගරු භාණ්ඩාගාරික |
| 07 | ඩී.ඇම්. පොඩි බංඩා මයා | එල්.බී.10 | ගරු සභාපති |
| 08 | ටී.ජී.ප්‍රේමරත්න මයා | යූ.බී.3,4,5,6 | ගරු සභාපති |
| 09 | බී.ජී.ආරියසිංහ මයා | යූ.බී 07 | ගරු භාණ්ඩාගාරික |
| 10 | ඩී.ඇම්.ආනන්ද මයා | එල්.බී. 1ඒ බ:දු: | ගරු ලේකම් |
| 11 | ඒ.සිරිසේන මයා | එම්.01 | ගරු සභාපති |
| 12 | ආර්.කරුණාරත්න මයා | යූ.බී. 09 | ගරු සභාපති |
| 13 | පී.පියදාස ද සිල්වා | එල්.බී. 27 ශී 02 | ගරු සභාපති |
| 14 | එම්.එම්.මුතුබංඩා මයා | එල්.බී. 20 | ගරු සභාපති |
| 15 | බී.ඇම්.විජේරත්න මයා | යූ.බී. 02 | ගරු සභාපති |
| 16 | එබ්.ඒ.එස්.රත්නායක මයා | යූ.බී. 16 | ගරු භාණ්ඩාගාරික |
| 17 | ටී.එම්.ජයසුන්දර මයා | එල්.බී. 2,3 | ගරු ලේකම් |
| 18 | එච්.එම්.ප්‍රේමරත්න මයා | එල්.බී. 2,3 | ගරු සභාපති |
| 19 | කේ.එල්.ඩී.ජයවික්‍රම මයා | එල්.බී. 04 | ගරු භාණ්ඩාගාරික |
| 20 | රංජිත් විජේතුංග මයා | යූ.බී. 07 | ගරු සභාපති |
| 21 | එම්.ඒ. ජයසේන මයා | එල්.බී. 7 පහල | ගරු භාණ්ඩාගාරික |
| 22 | එස්.එම්.සෙනරත් ධර්මරත්න මයා | එල්.බී. 7 පහල | ගරු සභාපති |
| 23 | බී.ජී.නිමල් මයා | යූබී 3,4,5,6 | ගරු ලේකම් |
| 24 | එන්.විල්සන් මයා | එම්. එස්. 5 බුද්ධංගල | ගරු භාණ්ඩාගාරික |
| 25 | එම්.ආර්.සෝමපාල මයා | එම්.එස්. 5 බුද්ධංගල | ගරු ලේකම් |
| 26 | ඒ.එම්.බණ්ඩාර මයා | එල්.බී. 34,35,36 | ගරු ලේකම් |
| 27 | ආර්.ඇම්.පියසේන මයා | එල්. බී 16 | ගරු භාණ්ඩාගාරික |
| 28 | ඇල්.ඒ.එම්.කුමාරිහාමි මිය | ජී. 03 | ගරු ලේකම් |
| 29 | ආර්.ඩී.ශාන්ත රන්දෙනිය | යාය. 04 | ගරු භාණ්ඩාගාරික |
| 30 | එන්.පී. ගුණරත්න මයා | එම්. 08 | ගරු ලේකම් |
| 31 | බී.ජී.රංජිත් ප්‍රියන්ත මයා | එම්.5-2 | ගරු ලේකම් |
| 32 | එන්. ජී.අමරරත්න මයා | එල්.බී. 29/30/31/32/ශී1 | ගරු සභාපති |
| 33 | ඩී.එම්.පොඩිමහත්තයා මයා | එල්.බී. 6 | ගරු ලේකම් |
| 34 | වී.කේ.ගුණපාල | ජී. 4-7 | ගරු සභාපති |
| 35 | එල්.පී.එල්.සිසිර කුමාර මයා | එල්.බී. 04 | ගරු සභාපති |
| 36 | එච්.එම්.පියසේන මයා | එල්.බී. 11 | ගරු සභාපති |
| 37 | ඩබ්.ජී.ප්‍රේමදාස මයා | ජී. 13,14,16 | ගරු සභාපති |
| 38 | ටී.ඒ.එම්.විජේරත්න මයා | එම්. 17/20 | ගොවි නියෝජිත |
| 39 | ඩී.එම්.හීංබන්ඩා මයා | එම්. 9/11 | ගරු සභාපති |
| 40 | ඩී.එම්.චන්ද්‍රසේකර මයා | එල්. බී. 05 | ගරු සභාපති |
| 41 | එච්.එම්.පියදාස මයා | එල්.බී. 07 ඉහල | ගරු සභාපති |

| | | | |
|---|---|---|---|
| 42 | ඩබ්.ජී.බන්දුල මයා | එල්.බී. 14 | ගරු භාණ්ඩාගාරික |
| 43 | සී.එච්.කුමාර මයා | යූ.බී. 12 | ගරු සභාපති |
| 44 | ආර්.ඩී.පී.විජේසිංහ මයා | යූ.බී. 13,14,15 | ගොවි නියෝජිත |
| 45 | එච්.පී.ආර්.ඒකනායක මයා | එල්.බී. 21,22 | ගරු සභාපති |
| 46 | ඒ.පී.ධර්මදාස මයා | එල්.බී. 21,22 | ගරු ලේකම් |
| 47 | ජී.සුගතදාස මයා | යූ.බී. 13,14,15 | ගරුලේකම් |
| 48 | ජී.එච්.ජී.පුංචිබංඩා මයා | යූ.බී. 10/11 | ගරු භාණ්ඩාගාරික |
| 49 | ඩබ්.ජී.කරුණාදාස මයා | ජී.06 | ගරු භාණ්ඩාගාරික |
| 50 | ජී.එච්.සරත් කුමාර මයා | ජී. 11,15 | ගරු භාණ්ඩාගාරික |
| 51 | බී.ජී.මුතුබංඩා මයා | ජී.10 | ගරු ලේකම් |
| 52 | පී.ආර්.විජේරත්න මයා | එම්. 10-12 | ගරු සභාපති |
| 53 | කේ.ජේ.කේ.මැණිකේ මිය | එම්. 16-18 | ගරු භාණ්ඩාගාරික |
| 54 | එස්.එල්.වෙල්ලතම්බි මයා | කොන්ඩවටුවාන් | ගරු සභාපති |
| 55 | පී.ඇම්.ජයවර්ධන මයා | එල්. බී. 8 | ගරු භාණ්ඩාගාරික |
| 56 | ඩීකේ.එම්.ගුණසේකර මයා | එල්. බී. 15 | ගරු සභාපති |
| 57 | පී.එම්.ප්‍රියන්ත මයා | ජී. 9/12 | ගරු භාණ්ඩාගාරික |

න්‍යාය පත්‍රයට අනුව ආගම සිහි කිරීමෙන් අනතුරුව ගල්ඔය වම් ඉවුර ව්‍යාපාරයේ නේවාසික ව්‍යාපෘති කළමණාකරු ඊ. ක්‍රිස්ටී දේශප්‍රිය මහතා විසින් පැමිණ සිටි රජයේ නිළධාරි මහතුන් හා ගොවි නියෝජිත මහත්ම මහත්මීන් පිළිගැනීමෙන් අනතුරුව රැස්වීමේ කටයුතු ආරම්භ කරන ලදී.

**5. ආයතන සංවර්ධන කටයුතු :- නේවාසික ව්‍යාපෘති කළමනාකරු**

➢ **නිලවරණ පැවැත්වීම**

නිල කාළය අවසන් වී ඇති ගොවි සංවිධාන මෙම කන්නය ආරම්භ වීමට පෙර නිළවරණ පවත්වා අවසන් කිරීමට කටයුතු කරන ලෙස දැන්විය.

➢ **මහ සභා රැස්වීම් පැවැත්වීම**

මෙවරද කන්නය ආරම්භ කිරීමට පෙර ගොවි සංවිධාන 64 මහ සභා රැස්වීම් පවත්වා අවසන් කළ යුතු බවත්, ඒ සඳහා අද දිනයන් යොදා ගන්නා ලෙසත් ඉල්ලීය. ඒ අනුව රැස්වීම අවසානයේ දින වෙන් කර ගැනීමට එකඟ විය.

➢ **ගොවි සංවිධාන ගිණුම් විගණනය**

2017/18 මහකන්නය ආරම්භ වීමට පෙර පවත්වන මහ සභා රැස්වීම් පැවැත්වීමට පෙර ගිනුම් සකස් නොකළ ගොවි සංවිධාන වේ නම් ගිනුම් සකස් කර ගන්නා ලෙසත් මෙ වන විට ගොවි සංවිධාන 42ක් 2016 වර්ෂයට අදාල ගිණුම් විගණනය කර අවසන් කර ඇති බවත් ඉතිරි ගොවි සංවිධානද මෙම වර්ෂය අවසන් වීමට පෙර 2016 වර්ෂයේ විගණන කටයුතු අවසන් කරන ලෙසත් ඉල්ලීය.

**2017/18 මහ කන්නය සඳහා පෙර කන්න තීරණ ගැනීම**

**ඒ ඒ ආයතන වල යෝජනා ඉදිරිපත් කිරීම**

**06. වාරි මාර්ග දෙපාර්තමේන්තුව**

**ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු - අම්පාර**

2017.09.21 දිනට වැවේ ධාරිතාව අක්කර අඩි 61160 වන අතර, මෙවර මහ කන්නයේ වැව උතුරා ගියත්, ඉදිරි යල් කන්නය සඳහා ජලය ඉතිරි කර ගැනීමට පසුගිය යල කන්නයේ ජලය කළමනාකරණය කල ආකාරයටම කටයුතු කරමු යි ගොවි නියෝජිතයින්ගෙන් ඉල්ලා සිටියේය.

**වාරිමාර්ග දෙපාර්තමේන්තුව 2017/2018 මහ කන්නය සඳහා ඉදිරිපත් කරන ලද කන්න යෝජනා**

**ප්‍රාදේශිය වාරිමාර්ග ඉංජිනේරු :- අම්පාර**

**වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ යෝජනා**

1. කෙත් ඇලවල් හා බෙදුම් ඇලවල් ගොවීන් වාරිමාර්ග දෙපාර්තමේන්තුව විසින් නඩත්තු වැඩ අවසන් කළයුතු දිනය - 2017.09.30
2. පසුගිය වගා රටාව පදනම් කරගෙන වගා කිරීමට යෝජිත බිම් ප්‍රමාණය - අක්:48354
3. කන්න ආරම්භ කරන දිනය - 2017.10.15
4. කන්නය සඳහා සුදුසු බෝග වර්ගය - වී මාස 3 ,3 ½
5. ජලය නිකුත් කිරීම -

   ජලාශයේ මේ වන විට ඉතා අඩු ජල මට්ටමක් පවතින බැවින් ජලය නිකුත් කිරීම නිශ්චිතව සඳහන් කිරීමට නොහැක. 2018.01.01 දින සිට 2018.02.15 දක්වා ජලාශයේ ඒ වන විට පවතින ජල තත්වය සැළකිල්ලට ගෙන ව්‍යාපාර කලමනාකරණ කමිටු රැස්වීමේදි සාකච්ඡා කොට අවශ්‍යතාවය මත ජලය නිකුත් කිරීම සුදුසු වන අතර,2017.12.31 දක්වා වර්ෂා ජලයෙන් වගා කටයුතු සිදු කිරීම

6. බිම් සකස් කිරීමේ අවසන් දිනය - 2017.11.15

6. ගවයින් හා ට්‍රැක්ටර් යායෙන් ඉවත් කළ යුතු දිනය - 2017.11.15

7. මුර ක්‍රමය යටතේ ජලය නිකුත් කිරීම - දිනයක් නිශ්චිත සදහන් කළ නොහැක

**නේවාසික ව්‍යාපෘති කළමනාකරු - ගල්ඔය වම් ඉවුර ව්‍යාපාරය**

වැවේ පවතින ජල ධාරිතාවය අඩු බැවින් වගාව පිහිටුවීම වැසි ජලය පදනම් කරගෙන සිදු කල යුතු බවත්, වැසි ලැබුණහොත් 2017/2018 මහ කන්නය සඳහා ගැටලුවක් නොමැති බවත්, වැසි නොලැබුනහොත් වගකීම ගොවි මහතුන් භාරගත යුතු වන බවත් පැවසීය.
ඊට සභාවෙන් විරෝධතාවක් එල්ල නොවීය.

**07. කෘෂිකර්ම දෙපාර්තමේන්තුව**

**කෘෂිකර්ම උපදේශක - මායාදුන්න**
වාරිමාර්ග දෙපාර්තමේන්තුව 2017/2018 මහ කන්නය සඳහා ඉදිරිපත් කළ යෝජනා වලට කෘෂිකර්ම දෙපාර්තමේන්තුව වෙනුවෙන් එකඟ වන බව පැවසීය.

**ගරු ලේකම් :- එම් 08 බෙදුම් ඇල ගොවි සංවිධානය**
කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට කළට වේලාවට බිත්තර වී සැපයීම කළ හැකිදැයි විමසීය.
**කෘෂිකර්ම උපදේශක - බීජ හා රෝපන**
අවශ්‍ය බීජ වී සැපයීම කල හැකි බව පැවසීය.

**මූලස්ථාන කෘෂිකර්ම උපදේශක :- උහන**
හැම කොට්ඨාශයකම යාය 02 වැඩසටහන ක්‍රියාත්මක වන බවත්, මෙමගින් බිත්තර වී නිශ්පාදනය කරන බවත්, ලියාපදිංචි බිත්තර වී නිශ්පාදකයන් අම්පාරේද සිටින බවත්, අම්පාරේ බිත්තර වී නිශ්පාදනයේ අතිරික්තයක් පවතින බවත් පැවසීය.

**නේවාසික ව්‍යාපෘති කළමනාකරු**
බිත්තර වී අතිරික්තයක් තිබුනද, නියම වේලාවට සපයා ගැනීමේ අපහසුතාවයක් පවතින බව පැවසීය.

**මූලස්ථාන කෘෂිකර්ම උපදේශක - උහන**
අපගේ ගොවි මහතුන් කන්නය ප්‍රමාද කිරීම තුළ වෙනත් ප්‍රදේශවල (අක්කරපත්තු/සම්මන්තුරේ) ගොවීන් පැමිණ වේලාසන බිත්තර වී රැගෙන යන බව පැවසීය.

**ගරු සභාපති - යූබී 12 බෙදුම් ඇල ගොවි සංවිධානය**
බීජ වී අවශ්‍යතාවයෙන් 13% පමණ කෘෂිකර්ම දෙපාර්තමේන්තුව බිත්තර වී නිශ්පාදනය කරන බවත්, බොහෝ ගොවි මහතුන් අන්තිම මොහොතේ බිත්තර වී සොයා ගැනීමට උත්සාහ කරන බැවින්, මෙම ගැටලුවට මුහුණ දෙන බව පැවසීය.

**කෘෂිකර්ම උපදේශක - බීජ හා රෝපන අංශය**

ඔක්තෝබර් 01 දින සිට බිත්තර වී නිකුත් කරන බවත්, ඒ අනුව පහත සදහන් බිත්තර වී බීජ හා රෝපන අංශයෙන් මිලදී ගත හැකි බවත් පැවසිය.

94/1,367,362,358,360,400

බීජ වී වල මිළ ගනන් පහත පරිදි වේ.

| | | | |
|---|---|---|---|
| ලියාපදිංචි බිත්තර වී | - | නාඩු | බුසල් 1ක් රු.1950.00 |
| | | සම්බා | බුසල් 1ක් රු.2000.00 |
| සහතික කරන ලද බිත්තර වී - | | නාඩු | බුසල් 1ක් රු.1800.00 |
| | | සම්බා | බුසල් 1ක් රු.1850.00 ක් බව |

ප්‍රකාශ කරන ලදී.

**ගරු සභාපති - යුබී 3,4,5,6 බෙදුම් ඇල ගොවි සංවිධානය**

කිලෝ මීටර් 40 ක් 50 ක් දුර ගෙවා බිත්තර වී ලබා ගැනීමට මල්වත්ත රජයේ ගොවිපලට යා නොහැකි බවත්, අම්පාර බීජ හා රෝපන කාර්යාලයෙන් එම බීජ ලබා ගැනිමට අවශ්‍ය පහසුකම් සලසා දෙන ලෙසත් ඉල්ලිය.

**එල්බී 19 බෙදුම් ඇල ගොවි සංවිධානය**

ගමට අවශ්‍යය බිත්තර වී ප්‍රමණය ගමට ගෙන්වා ගත හැකි දැයි විමසීය.

**කෘෂිකර්ම උපදේශක - බීජ හා රෝපන කාර්යාලය**

ගොවි සංවිධාන එකතු වී බීජ වී අවශ්‍ය ගොවින්ගේ ලැයිස්තුවක් සකසා ඒ සමග මුදල් බැදීමෙන් අනතුරුව එම බීජ ගමට ගෙනවිත් දිය හැකි බව පැවසීය.

**ගරු සභාපති - යුබී 2 බෙදුම් ඇල ගොවි සංවිධානය**

කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ මිළදී ගත් බිත්තර වී වල 6% පමණ වල් වී පැවති බව පැවසීය.

**කෘෂිකර්ම උපදේශක - බීජ හා රෝපන කාර්යාලය**

කෘෂිකර්ම දෙපාර්තමේන්තුව පුද්ගලික අංශයෙන් ද බිත්තර වී සපයා ගත් බවත්, එහිදී මෙම ගැටළුව ඇති වූ බවත් පැවසීය.

**08. ගොවිජනසේවා දෙපාර්තමේන්තුව**

**ගොවිජන සේවා ප්‍රාදේශීය නිළධාරි - මායාදුන්න**

ඔක්තෝබර් 15 දින කන්නය වර්ෂාවෙන් ආරම්භ කිරීමට ගත් තීරණයට ගොවි ජනසේවා දෙපාර්තමේන්තුව එකඟ බවත්, පසුගිය කන්නයේ සිදුකළ ආකාරයටම සහනාධාර පොහොර වැඩසටහන ක්‍රියාත්මක වන බවත්, නව පොහොර සහනාධාර චක්‍රලේඛණයට මෙවර අළුතින් කොටසක් එකතු කර ඇති බවත්, ඒ අනුව පොහොර සහනාධාරය ලබන ගොවියාට හිමි ඇල කොටස් නිසි පරිදි සුද්ද කර ඊට ගොවි සංවිධානයේ නිර්දේශය ලබා ගෙන, අනතුරුව කෘෂිකර්ම පර්යේෂණ නිෂ්පාදන සහකාරගේ නිර්දේශයද ලබා ගත යුතු බවත් පැවසීය.තවද මෙවර පොහොර සහනාධාර මුදල් ගෙවීම අදියර 03 කින් සිදු කරන බවත් පැවසීය.

ගරු භාණ්ඩාගාරික - යූබී 16 බෙදුම් ඇල ගොවි සංවිධානය
පොහොර අයදුම්පත් භාරදිය යුතු අවසන් දිනයන් තිබේ දැයි විමසීය.

ගරු සභාපති - එල්බී 19 බෙදුම් ඇල ගොවි සංවිධානය
එක් පුද්ගලයෙකුට ඇලවල් ගණනාවක කුඹුරු පවතින බවත්, අක්කර 05කට වැඩි නම් අතිරේක කුඹුරු වලට පොහොර සහනාධාරය ලබා දෙනවා දැයි විමසීය.

ගොවිජන සේවා ප්‍රාදේශීය නිළධාරි - මායාදුන්න
එක් පුද්ගලයෙකුට අක්කර 05කට වඩා පොහොර සහනාධාර මුදල් ලබා නොදෙන බව පැවසීය.

**09. කෘෂි රක්ෂණ මණ්ඩලය**

ක්ෂේත්‍ර නිළධාරි - කෘෂි රක්ෂණ මණ්ඩලය
වගා කාලසටහනට අනුව වගා රක්ෂණ කටයුතු පෙර සේම සිදු කරන බව පැවසීය.
තවද පහත කරුණු ඉදිරිපත් කලේය.

| ▪ අක්කර 01ක් සදහා අය කරන වාරික මුදල | පූර්ණ හානියකදී අක්කර 01 ක් සදහා ගෙවන වන්දි මුදල |
|---|---|
| 1500 | 25000.00 |
| 1800 | 30000.00 |

- පසුගිය කන්නයේ වන්දි ගෙවීම් කටයුතු මේ වන විට අවසන් කර ඇති බවත්, ලංකා බැංකුවෙන් හා මහජන බැංකුවෙන් ණය ගන්නා අයට එම බැංකු වලින්ම රක්ෂණ අයදුම්පත ලබාගත හැකි බවත්
- හානි දැනුම් දීමේදි අම්පාර කාර්යාලයට දැනුම් දීමෙන් පසු එම කටයුතු සිදුකර ගත හැකි බවත්

- වන අලි හානි සඳහා රක්ෂණය කිරීමේදී වාර මුදලින් 10% අමතර ගෙවීමක් කල යුතු බවත්
- ගොවි විශ්‍රාම වැටුප් ක්‍රමයට නැවත දායක කිරීමක් හෝ අළුත් කිරීමක් සිදු නොකරන බවත්
- එමෙන්ම ඉතා අඩු වාරික මුදලකට වාහන සම්බන්ධයෙන් තුන්වන පාර්ශවයේ රක්ෂණයන් සිදු කරන බවත්, යතුරු පැදියක් සඳහා රු.470 ක් බවත්

ගොවි නියෝජිතයින්ගේ යෝජනා ඉදිරිපත් කිරීම

සේනානායක සමුද්‍රේ මහ කන්නයේ වගාවට ප්‍රමාණවත් ජලය නොමැති නිසා වර්ෂා ජලය උපයෝගී කර ගෙන කන්නය ආරම්භ කර පවත්වාගෙන යාමට ගත් තීරණයට ගොවි නියෝජිතයන් එකඟතාව පල කලේය.

නේවාසික ව්‍යාපෘති කළමනාකරු
වර්ෂාව අඩුවුවහොත් මහ කන්නයේ වගාව අනතුරුදායක තත්වයක පවතින බැවින්, සියළු දෙනාම වගාව රක්ෂණය කර ගන්නා ලෙස ඉල්ලීමක් කළේය.

අනතුරුව යුබී 12 බෙදුම් ඇල ගොවි සංවිධානයේ ගරු සභාපති සී.එච්.කුමාර මහතාගේ යෝජනාවෙන් හා එල්බී 14 බෙදුම් ඇල ගොවි සංවිධානයේ ගරු භාණ්ඩාගාරික මහතාගේ ස්ථිරත්වයෙන් පහත වගා කාලසටහන සභා සම්මත විය.

| | | |
|---|---|---|
| 01. | කෙත් ඇලවල් හා බෙදුම් ඇලවල් ගොවීන්/වාරිමාර්ග දෙපාර්තමේන්තුව විසින් නඩත්තු වැඩ අවසන් කල යුතු දිනය | 2017.10.10 |
| 02. | පසුගිය වගා රටාව පදනම් කර ගෙන වගා කිරීමට යෝජිත බිම් ප්‍රමාණය | අක්කර 48354 |
| 03. | කන්නය ආරම්භ කිරීමට යෝජිත දිනය | 2017.10.15 |
| 04. | කන්නය සඳහා සුදුසු බෝග වර්ගය හා බෝග රටාව | වී මාස 3/3½ |
| 05. | ජලය නිකුත් කිරීම - ආරම්භක දිනය<br>- අවසාන දිනය<br>(ජලාශයේ පවතින ජල තත්වය සැළකිල්ලට ගෙන ව්‍යාපාර කමිටුවේ සාකච්චා කොට අවශ්‍යතාවය මත ජලය නිකුත් කිරීම සිදු කෙරේ) | 2018.01.01<br>2018.02.15 |
| 06. | බිම් සකස් කර වපුරා අවසන් කල යුතු දිනය | 2017.11.15 |
| 07. | මුර ක්‍රමය යටතේ ජලය සැපයීමට සුදුසු කාලය | නැත |
| 08. | ගවයන් හා ට්‍රැක්ටර් ක්ෂේත්‍රයෙන් ඉවත්කල යුතු අවසන් දිනය | 2017.11.15 |
| 09. | ඇලවේලි වලට හානි කරන්නන්ගෙන් අයවියයුතු දඩ | වාරිමාර්ග දෙපා: |

| | | |
|---|---|---|
| | මුදල | තක්සේරුව අනුව |
| 10. | ඇලවේලි සුද්ද නොකරන්නන්ගෙන් අයවිය යුතු දඩ මුදල | මීටරයකට රු:100/- |
| 11. | ගොවි සංවිධාන විසින් මෙහෙයුම් නඩත්තු වැඩ සඳහා අය විය යුතු මුදල (අක්කරයකට) | රු:100/- |
| 12. | අයාලේ යන ගවයන් ඇල්ලීමේ ගාස්තුව | එක් ගවයකුට රු:500/- |

ඉදිරිපත් වූ වාරිමාර්ග ගැටළු

**01.** ගරු සභාපති - එම් 08 බෙදුම් ඇල ගොවි සංවිධානය
එම් 08 බෙදුම් ඇලේ විශාල උමගක් යන බවත් එය සකසා දෙන ලෙස

**02.** ගරු සභාපති - යූබී 10/11 බෙදුම් ඇල ගොවි සංවිධානය
ප්‍රධාන බන්ට එකේ කැඩී යාමට ආසන්න ස්ථානයක් පවතින බවත්, එය සකසා දෙන ලෙස

**03.** ගරු සභාපති - ජී.06 බෙදුම් ඇල ගොවි සංවිධානය
ජී. 06 ඇලේ නඩත්තු කටයුතු සෑහෙන කාලයකින් සිදු නොවූ බවත්, ඇල සකස් කළ යුතුව ඇති බව

**04.** ගරු ලේකම් - එල්බී 16 බෙදුම් ඇල ගොවි සංවිධානය
එල්බී 16 ඇලේ බන්ට පාර මීටර් 200 ක පමණ කොටස සකසා ගැනීමට යන්ත්‍රයක් ලබා දෙන ලෙස

**05.** ගරු සභාපති - එල්බී 19 බෙදුම් ඇල ගොවි සංවිධානය
එල්. බී. 19 ඇලේ පිරිපිටවාන යටින් වතුර කාන්දු වන බවත්, එය සකසා දෙන ලෙස

**06.** ගරු භාණ්ඩාගාරික - බුද්ධංගල බෙදුම් ඇල ගොවි සංවිධානය
**වම් ඇලේ අගාවත සම්මන්තුරේ කොටස අම්පාර වාරිමාර්ග අධ්‍යක්ෂතුමා යටතේ පාලනය වන බවත්, අම්පාර වාරිමාර්ග ඉංජිනේරු යටතේ පාලනය වන ගොවි සංවිධාන සඳහා මෙහෙයුම් නඩත්තු මුදල් ලැබුනත් සම්මන්තුර වාරිමාර්ග ඉංජිනේරු යටතේ පාලනය වන කොටසේ ගොවි සංවිධාන සඳහා මෙහෙයුම් නඩත්තු මුදල් නොලැබෙන බව පැවසීය.**

නේවාසික ව්‍යාපෘති කළමනාකරු :- මේ සම්බන්ධයෙන් වාරිමාර්ග අධ්‍යක්ෂතුමා සමග සාකච්ඡා කරතීරණයකට ඒමට එකඟ විය.

**07. ගරු සභාපති - යූබී 13,14,15 බෙදුම් ඇල ගොවි සංවිධානය**

බෙදුම් ඇල ගොඩ වී ඇති බවත්, ගොඩ දමා දෙන ලෙසත් ඉල්ලීය. යූ.බී.15 ඇල සම්පූර්ණයෙන්ම පාහේ ගොඩ වී ඇති බවත්, හාරා දෙන ලෙසත්

**ප්‍රාදේශීය වාරි මාර්ග ඉංජිනේරු - අම්පාර**

මේ වන විට දෙපාර්තමේන්තුව සතු මැෂින් සියල්ලම නඩත්තු වැඩ සඳහා යොදවා ඇති බවත්, එම වැඩ අවසන් වූ පසු ඇළවල් වල වැඩ සඳහා මැෂින් ලබා දෙන බවත්, ඇළවල් වල කොන්ක්‍රීට් වැඩ සඳහා ඇස්තමේන්තු සකස් කර පුනරුත්තාපන ව්‍යාපෘති සඳහා යොමු කර ඇති බවත්, ඊ ලඟ ව්‍යාපාර කලමනාකරණ කමිටු රැස්වීමේදි මේ සම්බන්ධව සාකච්ඡා කරමු යයි ද ප්‍රකාශ කළේය.

## 10. වෙනත්

**01. ගරු ලේකම් - ජී 10 බෙදුම් ඇල ගොවි සංවිධානය**

ප්‍ර දේශ ගණනාවකට ගව හානි පවතින බවත්, එහිදී ඇල බන්ට පවා විනාශ වන බවත් පැවසීය.

**02. ගරු සභාපති - යූබී 12 බෙදුම් ඇල ගොවි සංවිධානය**

ගවයින් නිසා උදේට පාසල් ළමුන්ට පාරේ යාමට වත් නොහැකි තත්ත්වයක් පවතින බව පැවසීය.

**03.ගරු සභාපති - එල්බී 20 බෙදුම් ඇල ගොවි සංවිධානය**

තුන්වන කන්නයේ මුං ඇට, කව්පි, ගර්කින් වැනි අතිරේක භෝග වගාකර ඇති බවත්, මෙහිදී ගවයින්ගෙන් විශාල හානි සිදුවන බවත්, අයාලේ යන ගවයන් ඇල්ලුවහොත් වන්දි ලබාගත හැකිදැයි විමසීය.

නේවාසික ව්‍යාපෘති කළමනාකරු :- අයාලේ යන ගවයන් අල්ලා නිසි ක්‍රමවේදයට අනුව කටයුතු කල හොත් අලාභයට වන්දි ලබා ගත හැකි බව පැවසීය.

**ගරු සභාපති - එල්බී 19 බෙදුම් ඇල ගොවි සංවිධානය**

පසුගිය දිනවල ගවයින්ගෙන් වගාවට හානි සිදු වූ බවත්, මේ ගැන පොලිසියට පැමිණිලි කළ බවත් පොලිසිය සමථ මණ්ඩලයට යොමු කර ඇති බවත්, තවමත්

විසඳුමක් නොමැති බවත්, රුපියල් 10000.00 ක් පමණ මේ සඳහා වියදම් වූ බවත් පැවසීය.

**04. විදුහල්පති - ඩී.එස්. සේනානායක විද්‍යාලය, ඉඟිණියාගල**

ඉඟිණියාගල ඩී.එස්.සේනානායක විද්‍යාලය ඉදිරිපස සේනානායක පිළිරුව ගලින් නෙලීමේ වැඩපිළිවෙලක් දියත් කර ඇති බවත්, ඒ සඳහා ලක්ෂ 500000.00ක පමණ මුදලක් වැය වන බවත්, මේ සඳහා ගොවි සංවිධාන වලට කළ හැකි යම් උපකාරයක් වේ නම් කරන ලෙසත් ඉල්ලීය. එසේම 2017.10.20 දින මෙම කාර්යයට මුල්ගල තැබීම සිදු කරන බවත් ප්‍රකාශ කර සිටින ලදි.

**05. පැඩල් බෝට්ටු සේවාවක් අම්පාර වැවේ ආරම්භ කිරීම**

නේවාසික ව්‍යාපෘති කළමනාකරු - අම්පාර වැවේ පැඩල් බෝට්ටු සේවාවක් ආරම්භ කිරීම සඳහා ඉල්ලීමක් ලැබී ඇති බවත්, ඒ සඳහා ව්‍යාපාර කළමනාකරණ කමිටු රැස්වීමේ සාකච්ඡා කර තීරණය ලබා දෙන ලෙස අම්පාර ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු විසින් ඉල්ලීමක් කර ඇති බව පැවසීය.

ඒ අනුව එම කරුණ සාකච්ඡාවට ගන්නා ලදි.

වෙනුර ප්‍රගීත් ටෙට්ටිගමගේ මහතා :- සංචාරක ව්‍යාපාරය ලංකාවට ආදායම් ලැබෙන ප්‍රධාන මාර්ගයක් බවත්, අම්පාර වැවේ පැඩල් බෝට්ටු සේවාවක් ආරම්භ කිරීමට බලාපොරොත්තු වන බවත්, මෙය ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු වන්නේ පෙ:ව 8.00 සිට ප:ව 5.00 දක්වා බවත්, වැවේ යම් කිසි තෝරාගත් සීමාවක සිදු කිරීමට බලාපොරොත්තු වන බවත් ඒ සඳහා ප්‍රදේශයේ ගොවි නියෝජිත මහතුන්වන ඔබලාගේ අනුමැතිය ලබා දෙන ලෙසත් ඉල්ලීය.

ගරු සභාපති - යූබී 12 බෙදුම් ඇළ ගොවි සංවිධානය
මේ තුළින් ප්‍රදේශයේ සංස්කෘතිය විනාශ වන බවත්, ජලය හා වැව විනාශ වන බවත්, තවත් විවිධ ගැටළු ද ඉදිරියේදී මතු විය හැකි බවත් ප්‍රකාශ කරමින් මේ සඳහා විරෝධය පළ කළේය.

ගරු සභාපති - එල්බී 7 පහළ බෙදුම් ඇළ ගොවි සංවිධානය
සිය ගොවි සංවිධානයේ අකමැත්ත ප්‍රකාශ කර සිටින ලදී.

ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු - අම්පාර
ග්‍රෙගරි වැවේද මෙම බෝට්ටු සේවය පවතින බවත් එහිදි ගැටලු සහගත තත්ත්වයක් ඇති වී නොමැති බවත් පැවසීය.

වෙනුර ප්‍රගීත් මහතා - වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ සියලු කොන්දේසි වලට යටත්ව මෙම සේවාව ආරම්භ කරන බව පැවසීය. මෙහිදී

- ❖ පොලිතීන්,වැසිකිළි,ප්ලාස්ටික් ආදිය පාවිච්චි කිරීමට ලබාපොරොත්තු නොවන බවත්,
- ❖ විදේශය සංචාරකයින්ට විවෘත නොකොර දේශීය සංචාරකයින්ට හා ළමයින්ට පමණක් විවාත කිරීමට කටයුතු කළ හැකි බවත් පැවසීය.

ගරු සභාපති - එම් 01 බෙදුම් ඇල ගොවි සංවිධානය
පැඩල් බෝට්ටු සේවයට විරුද්ධත්වය ප්‍රකාශ කලා

ගරු සභාපති - එල්බී 07 පහළ බෙදුම් ඇල ගොවි සංවිධානය
ඉගිනියාගල වැව ඩී.එස්.සේනානායක මහතා ඇති කලේ ගොවි ජනතාව මුල් කරගෙන බවත්, අද වන විට මෙම වැව විවිධ කාර්යන් සලසා යොදවා ගැනිම තුළ ගොවින් යම් යම් අපහසුතාවයන්ට දැනටමත් මුහුන දෙන බව පැවසීය.

භාණ්ඩාගාරික - යාය 4 බෙදුම් ඇල ගොවි සංවිධානය
විරෝධය ප්‍රකාශ කරන ලදී.
අවසානයේ මුළු ව්‍යාපාර කමිටුවේම ඊට විරෝධය පල කළේය.

අනතුරුව 2017/2018 මහ කන්නයේ අලුත් සහල් මංගලොය් කටයුතු සාකච්ඡා කිරීමෙන් පසු සාකච්ඡා කිරීමට වෙනත් කාරනා නොවූයෙන් ගල්ඔය වම් ඉවුර නේවාසික ව්‍යාපාති කළමනාකරු ඊ.ක්‍රිස්ට දේශප්‍රිය මහතාගේ ස්තුති කතාවෙන් පසු රැස්වීමේ කටයුතු ප:ව 1.30ට පමණ අවසන් විය.

| | |
|---|---|
| සකස් කළේ:- | ඊ. ක්‍රිස්ටි දේශප්‍රිය |
| කේ.එස්.කේ. හේරත් | නේවාසික ව්‍යාපෘති කළමනාකරු |
| සංවර්ධන සහකාර | ගල්ඔය වම් ඉවුර ව්‍යාපාරය |
| | අම්පාර. |